# පර්යේෂණ යෝජනාවක් සකස් කිරීම

- පාහියංගල සුමංගල හිමි

## ප්‍රවේශය

පර්යේෂණයක් යනු යම් කරුණක් පිළිබඳව දැනගැනීමේ රුචිකත්වය හෝ අවශ්‍යතාව මත සිදුකරන ක්‍රියාවලිය නොහොත් දැනුම ලබාගැනීම සඳහා පරීක්ෂා කර බැලීම ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. මෙය ඥාන සම්පාදනය මූලික කරගත් උත්සාහයක් ලෙසද හැඳින්වීමට පුළුවන. මේ අනුව පර්යේෂණයක් යනු යම් සිද්ධියක් පිළිබඳව සියුම්ව ගැඹුරින් සොයා බැලීම සිදුවන අතර ඒ පිළිබඳ උගතුන් විවිධ අදහස් මතවාද පළකර ඇත. මේ අනුව රීඩ් මැන් සහ මෝරිට අනුව නව දැනුම ලබා ගැනීම සඳහා විධිමත්ව සිදුකරන උත්සාහය පර්යේෂණයක් ලෙස පෙන්වා දී ඇත. පර්යේෂණයක් යනු ප්‍රශ්නයකට උත්තර ලබාගැනීමට උත්සාහය කිරීමක් ලෙස ලැන්ගෙබාච් සරලව දක්වා ඇත (Langenbach, 1994: 1). මේ අනුව පර්යේෂණ මගින් අධ්‍යයනය කිරීම, නිරීක්ෂණය කිරීම, සැසඳීම හා අත්හදා බැලීම මගින් නව දැනුම උත්පාදනයට මග පෑදේ.

යෝජනාවලියක් (Research Proposal) යනු යම් කටයුත්තක් නිසි පරිදි සිදුකිරීම සඳහා භාවිත කරන පූර්ව සූදානම නැතහොත් මූලික රාමුව සකසා ගැනීම ලෙස හඳුනාගත හැකිය. මේ අනුව පර්යේෂණ යෝජනාවලියක් යනු පර්යේෂණයට ලක්කෙරෙන අදහසේ මූලික රාමුව, එය පර්යේෂණය කිරීමේ වැදගත්කම සහ පර්යේෂණයේ අනුගමනය කරන විධික්‍රම පැහැදිලි කිරීමකි. යම් පර්යේෂකයෙකු තමා විසින් පර්යේෂණය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ඉදිරිපත් කරන සැකිල්ල ද පර්යේෂණ යෝජනාවලිය ලෙස සරලව පැහැදිලි කරගත හැකිය. සාර්ථක පර්යේෂණ යෝජනාවලියක් යනු පර්යේෂණය සාර්ථකව අවසන් කිරීමට භාවිත කරන සිතියමක් වැනිය. මෙමගින් පර්යේෂණය ක්‍රමානකූලව සිදුකිරීම සඳහා නිවැරදි මාර්ගෝපදේශනයක් ලැබෙනු ඇත.

ඕනෑම පර්යේෂකයෙකු පර්යේෂණ ගැටලුවක් හඳුනා ගැනීමෙන් පසු එම ගැටලුව නිරාකරණය කිරීමට උත්සාහ ගන්නා අතර එම ක්‍රියාවලිය උපදේශාත්මක සහයක් ඇතිව සිදුකිරීම වැදගත් වේ. එය පර්යේෂකයාට පර්යේෂණය මෙහෙයවීම සඳහා ක්‍රමානුකූල ක්‍රියාපිළිවෙලක් සහිත සැලසුමක් ද ලබා දෙයි. මෙවැනි සාර්ථක පර්යේෂණ යෝජනාවලියක් සැකසීමේදී මූලික කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ (සේනාධීර සහ වනසිංහ, 2004: 177).

01. සිදුකරන පර්යේෂණය මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු කුමක ද?
02. පර්යේෂණයේ ඇති වැදගත්කම සහ අවශ්‍යතාව කුමක් ද?
03. පර්යේෂණය ක්‍රියාත්මක කරන්නේ කවර පියවර අනුගමනය කරමින් ද?

මෙම කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් ඉහත ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන ලෙස පර්යේෂණ යෝජනාවලිය සැකසීම මගින් පර්යේෂණයේ සමස්තය විග්‍රහ කිරීමට හැකියාව ලැබේ.

**පර්යේෂණ යෝජනාවක වැදගත්කම**

සෑම ශාස්ත්‍රඥයෙකුටම පර්යේෂණයක් සිදුකිරීමට සිදුවන අතර එම පර්යේෂණය සාර්ථක කරගැනීමට නම් එයට මගපෙන්වීමක් වශයෙන් පර්යේෂණ යෝජනාවලිය වැදගත් වේ. මෙය එකවර බිහිවන්නක් නොවිය හැකිය. යම් කාලයක් අත්හදා බැලීම හෝ නොමැතිව පර්යේෂණයකට ප්‍රවේශ වීමට පුළුවන. පර්යේෂණය කුමනාකාරයෙන් ආරම්භ වුවද ඒ සඳහා දළ සැලැස්මක්වත් පර්යේෂකයා සතුව තිබිය යුතුය. එම දළ සැලැස්ම පර්යේෂණ යෝජනාවලිය දක්වා සංවර්ධනය කිරීමෙන් එහි වැදගත්කම කියාපායි. මේ අනුව පර්යේෂකයා,

- තම අදහස් ඔස්සේ ගොඩනගා ගන්නා සැලසුම ක්‍රමානුකූලව දළ සැලසුම මගින් සංවර්ධනය කිරීම, එමගින් පර්යේෂණ යෝජනාවලියේ ඌනතා පහසුවෙන් හඳුනාගත හැකිය.

- පර්යේෂණ යෝජනාවලිය ගැන මනසින් සිතා ලේඛනගත නොකොට ක්‍රියා කිරීමෙන් පර්යේෂකයා පීඩාවට පත් කරයි. උපදේශක සමඟ සාකච්ඡා කරමින් පර්යේෂණය කිහිප වතාවක්ම රචනා කිරීමෙන් පර්යේෂණ යෝජනාවලිය සංවර්ධනය කරගත හැකිය.

පර්යේෂණ යෝජනාවලියක වැදගත්කම පිළිබඳව අදහස් දැක්වූ රේ හා මොන්ඩල් (2004) "පර්යේෂණ යෝජනාවක් පර්යේෂණයේ අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට ද, කාලය හා සම්පත් අපතේ යාම වළක්වා ගැනීමටද හේතු වේ. පර්යේෂණයේදී මතුවිය හැකි දුෂ්කරතා අවම කර ගැනීමට ද හේතු වේ" යනුවෙන් ප්‍රකාශ කර ඇත (Ray and Mondal, 2004: 285). පර්යේෂණ යෝජනාව යනු පර්යේෂකයාට ස්වකීය පර්යේෂණ ක්ෂේත්‍රය පිළිබඳ අලුත් යමක් හැදෑරීමට ඇති උනන්දුව සනිටුහන් කිරීමකි. පර්යේෂණ යෝජනාව පර්යේෂණ ගැටලුවක් අධ්‍යයනය කිරීමට ඇති සාධාරණ බව, එහි වටිනාකම අධ්‍යයනය කරගෙන යන ආකාරය පිළිබඳ ප්‍රකාශ කෙරේ (Heath and Tynan, 2010: 45). උපදේශකවරයා සමග පර්යේෂණය සම්බන්ධයෙන් ගනුදෙනු කිරීමේදී පර්යේෂණයේ සුදුසු නුසුදුසු බව නිගමනය වන්නේ පර්යේෂණ යෝජනාව සහිත සැලස්මෙනි. සාර්ථක පර්යේෂණ යෝජනාවක් සඳහා උපදේශකවරයා ඔහුගේ පර්යේෂණ යෝජනාව අඩුපාඩු මග හරවමින් සැකසීමට උපකාර වේ. පර්යේෂණය සඳහා මෙවැනි සාර්ථක පර්යේෂණ යෝජනාවක් ඉදිරිපත් වීම මගින් පර්යේෂණය අවසානය දක්වා නිවැරදිව ගමන් කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය වේ.

**පර්යේෂණ යෝජනාවකදී අවධානය යොමු කළ යුතු මූලික කරුණු**

පර්යේෂණ යෝජනාවලියක මූලික අඩිතාලම වනුයේ අපේක්ෂිත පර්යේෂණය පිළිබඳ මූලික අදහසක් ගොඩනගා ගැනීමයි. පර්යේෂණය පිළිබඳ මූලික අදහස පැමිණීමෙන් පසු එය පර්යේෂණ යෝජනාවලියකදී සාර්ථකව විස්තර කිරීමක් සිදුකළ හැකිය. ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය හදාරන සිසුන්ට පර්යේෂණ නිබන්ධය අනිවාර්ය අංගයක් වන අතර, එහිදී ආචාර්යවරයෙකු සමග පර්යේෂණය සිදුකිරීමට සිදුවේ. පර්යේෂණ නිබන්ධය සිදුකරන බොහෝ සිසුන්

ආචාර්යවරයා වෙත පැමිණෙන්නේ පර්යේෂණ මාතෘකාවක් ඇතිවය. එම පර්යේෂණ මාතෘකා විවිධ ස්වරූප ගන්නා අතර පර්යේෂණ ගැටලුව සකසා ගැනීම පසුව සිදුවේ. විටෙක පර්යේෂණ ගැටලුව මුලින් සකසා පසුව පර්යේෂණ මාතෘකාව සකසන අවස්ථා ද ඇති අතර එය සිදුවන්නේ පර්යේෂණයේ ස්වභාවය අනුවය. පර්යේෂණ ගැටලුව සමගින් පර්යේෂණය සිදුකිරීමට ශිෂ්‍යයා පෙලඹවීමෙන් මුලින්ම සිදුකළ යුත්තේ සිදුකිරීමට අපේක්ෂිත පර්යේෂණ ක්ෂේත්‍රය හා ශාස්ත්‍රීය සාහිත්‍යය ගැන සතුටුදායක පූර්ව දැනුමක් ලබා දීමට සැලැස්වීමය. පර්යේෂණ ගැටලුවකට පාදක විය හැකි ශාස්ත්‍රීය පොතපත ප්‍රමාණවත් පරිදි කියවීමෙන් පසු පර්යේෂණ අදහසක් (Research Idea) මෙන් ම එය පර්යේෂණ යෝජනාවලිය සාර්ථක කර ගැනීමට ද රුකුලක් වේ. ශාස්ත්‍රීය පොතපත කියවීමට අමතරව තම හිත මිතුරන් සහ ගුරුවරුන් සමඟ පර්යේෂණ පසුබිම පිළිබඳව සාකච්ඡා කළ යුතුය. හුදෙකලා ක්‍රියාවක් මගින් හිතනවාට වඩා සාමූහික ශ්‍රමයක් මගින් අදාළ පර්යේෂණ පැතිකඩ පිළිබඳව ක්‍රියාකළ යුතුය. එකම මාතෘකාවක් හෝ එකම පර්යේෂණයක් නැවත නැවතත් සිදුකිරීම කාලය මුදල් ශ්‍රමය අපතේ යැවීමකි. එය එසේ වුවත්, සිදුකර ඇති පර්යේෂණයක අඩුපාඩු සහ මග හැරීම් හඳුනාගනිමින් අලුත් මුහුණුවරකින් පර්යේෂණයක් සඳහා යෝජනාවලියක් සැකසීම ද කළ හැකිය.

**පර්යේෂණ යෝජනාවලියක මූලික ආකෘතිය**

පර්යේෂකයා විසින් පර්යේෂණ යෝජනාවලියක් සැකසීමේදී අවධානය යොමු කළ යුතු මූලික කරුණු කිහිපයක් ඇත. පර්යේෂකයා සතුව පර්යේෂණ යෝජනාවලිය පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. තමන් තෝරාගත් පර්යේෂණ ප්‍රවේශයට සහ පර්යේෂණ ගැටලුවට අනුකූලව පර්යේෂණ යෝජනාවලිය සකසා ගත යුතුය. පළමු උපාධි නිබන්ධය හෝ පශ්චාත් උපාධි නිබන්ධය හෝ වෙනත් පර්යේෂණ නිබන්ධයක පර්යේෂණ කටයුත්තක් සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ යෝජනාවලියේ ව්‍යූහය සමාන ස්වරූපයක් ගනියි. එසේ වුවද පර්යේෂණ යෝජනාවක පොදු ආකෘතිය පර්යේෂණයේ හෝ ව්‍යාපෘතියේ ස්වභාවය අනුව වෙනස් වීමට ද පුළුවන. මේ අනුව පර්යේෂණ යෝජනාවලියක් සැකසීමේදී පහත සඳහන් මූලික

තේමාත්මක උපාංග පිළිබඳ අවධානය යොමු කරමින් පර්යේෂණ යෝජනාවලිය සැකසීමට උත්සුක විය යුතුය.

1. පර්යේෂණ මාතෘකාව
2. පර්යේෂණ ගැටලුව
3. සංදර්භය සහ පසුබිම
4. පර්යේෂණයේ වැදගත්කම
5. අරමුණු
6. සාහිත්‍ය විමර්ශනය
7. පර්යේෂණ උපන්‍යාසය / කල්පිතය
8. පර්යේෂණ ප්‍රශ්න
9. පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රම
10. පර්යේෂණ සීමා
11. පර්යේෂණ සැලැස්ම
12. ආශ්‍රිත ග්‍රන්ථ

**1. පර්යේෂණ මාතෘකාව**

පර්යේෂණ යෝජනාවලියක, පර්යේෂණ මාතෘකාව (Research Topic) අදාළ පර්යේෂණය කියවිය හැකි ආකර්ෂණීය මතෘකාවක් වීම වැදගත් වේ. පර්යේෂණය කියවන ඕනෑම කෙනෙකුට මුලින්ම ඇස යොමුවන්නේ පර්යේෂණ මාතෘකාව දෙසට ය. පර්යේෂණ මාතෘකාව තුළින් පර්යේෂණය පිළිබඳ සාරාංශව, සංක්ෂිප්තව සහ සාරාර්ථව ඉදිරිපත් කළ යුතු අතර එය පර්යේෂණයේ ස්වභාවය සහ වපසරිය පිළිබඳ කියාපාන්නකි (පරමානන්ද හිමි, 2014: 84). පර්යේෂණ මාතෘකාවක් සකස් කිරීමේදී පර්යේෂකයන් සැලකිල්ලට ගතයුතු මූලධර්ම වශයෙන් සැලකිය හැකි මිනුම් දඬු තුනක් ජයදේව උයන්ගොඩ පෙන්වා දී ඇත (උයන්ගොඩ, 2016: 149).

- පර්යේෂණ මාතෘකාවක් වාක්‍ය රචනා මාතෘකාවකින් වෙනස්විය යුතුය. නිදසුනක් ලෙස "පොළොන්නරුවේ වාරි කර්මාන්තය සඳහා පරාක්‍රමබාහු රජුගේ දායකත්වය" යනු වාක්‍ය රචනා

මාතෘකාවකි. මෙය කිසිසේත් පර්යේෂණ මාතෘකාවට ගැළපෙන්නේ නැත. "පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ වාරි කර්මාන්තය සඳහා බල පෑ සමාජ පසුබිම මූලාශ්‍රය සාධක ඇසුරින්" යනු පර්යේෂණ මාතෘකාවකි. පර්යේෂණයකදී වාක්‍ය රචනා මාතෘකාවක් නොලීමට පර්යේෂකයා වගබලාගත යුතු අතර සෑම විටකම මාතෘකාවේ පර්යේෂණ පෙනුමක් තැබීමට ක්‍රියාකළ යුතුය. වාක්‍ය රචනාවකදී පර්යේෂණයක් සිදු නොවන අතර එය පොත්පත් හෝ පුවත්පත් කියවා ලිවීමට හැකිය. පර්යේෂණ මාතෘකාවකදී ඊට අදාළ කරුණු ඉදිරිපත් කිරීමේදි එය ශාස්ත්‍රීය කාර්යයක් සේ සලකා පර්යේෂණ කළ යුතු අතර ඒ සඳහා න්‍යායික රාමුවක් තිබිය යුතුය.

- පර්යේෂණ මාතෘකාවේම පර්යේෂණයක් යෝජනා විය යුතුය.
- පර්යේෂණ මාතෘකාව අනවශ්‍ය ආකාරයෙන් දීර්ඝ නොවිය යුතුය. මාතෘකාව සකස් කිරීමේදී අඩුම වචන ප්‍රමාණයක් භාවිත කිරීමෙන් කියවන්නාට තේරුම් ගැනීමට පහසුවක් ඇති කරයි.

## 2. පර්යේෂණ ගැටලුව

පර්යේෂණ යෝජනාවලියක පර්යේෂණ ගැටලුව (Research Problem) නිවැරදිව හඳුනාගැනීම සාර්ථක පර්යේෂණයක් සඳහා උපකාරි වේ. ශාස්ත්‍රීය පර්යේෂණකදී සමස්ත යෝජනාවලියේම හරය තීරණය කිරීමට මූලික වශයෙන් බලපානු ලබන්නේ පර්යේෂණ ගැටලුවය. පර්යේෂණ ගැටලුවක් නොමැතිව පර්යේෂණයක් සිදුනොවන අතර පර්යේෂණයක් සිදුවීමට නම් පර්යේෂණ ගැටලුවක් අත්‍යවශ්‍යය. පර්යේෂණ නිබන්ධ ඇගයීමකදී පවා පරීක්ෂකවරුන්ගේ අවධානය පර්යේෂණ ගැටලුව දෙසයොමු වේ. සමස්ත යෝජනාවලියේ ම මෙන්ම අදාළ පර්යේෂණයට හරවත් බව මෙන්ම ගුණාත්මක බව තීරණය වන්නේද පර්යේෂණ ගැටලුව සාර්ථකව දක්වා තිබීමෙනි. බොහෝ පර්යේෂකයන් පර්යේෂණ යෝජනාවලිය සැකසීමේදී මුහුණ දෙන බැරෑරුම් අභියෝගයක් වනුයේ පර්යේෂණ ගැටලුව සකස් කිරීමය. පර්යේෂණය කිරීමට නියමිත විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමාණවත් කියවීමක් නොමැති වූ විට පර්යේෂණ ගැටලුව සකස් කිරීමට බාධා

පමුණුවයි. පර්යේෂණ ගැටලුවක් කෙනෙකුට හිතුමතේ ගොඩනැගිය නොහැකි අතර ඒ සඳහා පූර්ව අධ්‍යයනයක් තිබිය යුතුය. පර්යේෂණ ගැටලුව නිවැරදි ආකර්ෂණීය එකක් වීමටනම් එහි සරල සහ මූලික ගුණාංග තුනක් තිබිය යුතුය (උයන්ගොඩ, 2016: 44). එනම්,

- පර්යේෂණ ගැටලුව හරවත් පර්යේෂණ ව්‍යාපෘතියකට තුඩු දිය යුතුය.

- එය පර්යේෂකයාට හුදෙක් ආනුභවික අධ්‍යයනයක් පමණක් නොව න්‍යායික විග්‍රහයක් හා තර්කයක් ද ගොඩ නැගීමට අවකාශ සපයන්නක් විය යුතුය.

- එය නව දැනුම සම්පාදනය කිරීමට යොමුවූවක් විය යුතුය.

පර්යේෂණ ගැටලුවක් වනාහි ශාස්ත්‍රීය ගවේෂණයක් කිරීමට තරම් වැදගත්වන සංකල්පමය විමර්ශනයක් පිළිබඳ ප්‍රකාශයක් ලෙස අර්ථ ගැන්විය හැකිය. එය හුදෙක් ප්‍රශ්නයක්ම නොවේ. පර්යේෂණ ගැටලුවක් ශාස්ත්‍රීය ගවේෂණයකට ලක්කළ හැකි විය යුතුය. පර්යේෂණ ගැටලුවක් ගවේෂණය මගින් නව දැනුම සම්පාදනය කිරීමත්, එම නව දැනුම මගින් එම ගැටලුව අයත්වන විෂය ක්ෂේත්‍රයේ පවත්නා දැනුම ඉදිරියට යාමත් සිදුවිය යුතුය. (උයන්ගොඩ, 2016: 16). ජෝන් එල්රිජ් ට අනුව සමාජීය විද්‍යාඥයන් ගැටලුවක් තෝරා ගැනීමේදී "අප ජීවත්වන අවට ලෝකයේ සමහර පැතිකඩවල් ගැටලු සහගත මෙන්ම අධ්‍යයනය කිරීමට තරම් වටිනා දේවල්ද ලෙසින් තෝරා ගැනීමය" යනුවෙන් ප්‍රකාශ කර ඇත (උයන්ගොඩ, 2016: 16, 17). සමාජීය-මානවීය සාහිත්‍යයේ පර්යේෂණ ගැටලුවක් ගොඩනැගීමේදී ප්‍රහේලිකා සහ ගැඹුරු හරාත්මක ප්‍රශ්නයක් නැතහොත් ප්‍රශ්න කිහිපයක් ලෙස ගැටලුවක් සකස් කිරීම ප්‍රධාන ආකාර දෙකක් යටතේ පෙන්වා දිය හැකිය.

**(අ) පර්යේෂණ ගැටලුව ප්‍රහේලිකාවක් ලෙස,**

"සෑම මැතිවරණයකදි ම ඡන්දය දෙන ඡන්දදායකයන් පිළිබඳවය. පළාත් සභා හෝ පාර්ලිමේන්තු මැතිවරණයකදි මහජන

නියෝජිතයන් පත්කර ගැනීමේදී ඒ සඳහා තරග කරන අපේක්ෂකයෝ තම මැතිවරණය ජයග්‍රහණය සඳහා විවිධ පොරොන්දු දෙමින් ඡන්දදායකයන් තුළ විශ්වාසයන් ගොඩනංනවති. තම ජයග්‍රහණයෙන් පසු පාසල් ගොඩනැගිල සකස් කරදීම්, මංමාවත් සකස් කරදීම්, ජනතා ප්‍රශ්නවලට ඇහුම්කන් දීම් නිදසුන්ය. ජයග්‍රහණයෙන් පසු බොහෝ නියෝජිතයන් තමන් කිසිම පොරොන්දුවක් නොදුන්නා සේ කටයුතු කරන අතර ඡන්දදායකයන් අතරට යළි පැමිණෙන්නේ ඊළඟ මැතිවරණයේදීය. එම මැතිවරණයේදිද පහසුවෙන් ජයග්‍රහණය ලැබ කාලයක් දේශපාලන වේදිකාවේ කටයුතු කරති. මහජන ඡන්දයෙන් තේරීපත් වී යන මහජන නියෝජිතයන් ගමට රටට ජනතාවට සේවය කළ යුතු අතර එසේ නොකරත්, එම මහජන නියෝජිතයන්ම යළිත් මහජන නියෝජිතයන් ලෙස පත්කර යැවීමට ඡන්දදායකයන් පෙලඹෙන්නේ ඇයි? මෙය ලංකාවේ දේශපාලන ක්‍රමය සහ ජනතා පක්ෂපාතිත්වය පිළිබඳ ප්‍රහේළිකාවකි."

**(ආ) පර්යේෂණ ගැටලුව ගැඹුරු හරාත්මක ප්‍රශ්නයක් ලෙස,**

ශ්‍රී ලංකාවේ සමාජය පර්යේෂණ කර ඇති බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයෙකු වන ජොනතන් ස්පෙන්සර් 2007 වසරේදී පළ කළ Anthropology, Politics and the State (මානව විද්‍යව, දේශපාලනය සහ රාජ්‍යය) යන කෘතියෙහි පර්යේෂණ ගැටලුව සංකල්පමය ප්‍රශ්නයකි. පළමුවෙන් ප්‍රධාන ප්‍රශ්නය අසා එය පැහැදිලි කිරීමට තවත් අතුරු ප්‍රශ්නයක්ද අසයි. ග්‍රන්ථයේ පළමු පරිච්ඡේදයේ පළමු වාක්‍යයෙන්ම ගවේෂණයට ලක්කෙරෙන ශාස්ත්‍රීය ගැටලුව ඉතා සංක්ෂිප්ත ලෙස දක්වා ඇති අතර පර්යේෂණ ගැටලුවක් හරයාත්මක ප්‍රශ්නයක් ලෙස මෙසේ දක්වයි. ඒ අනුව

"දේශපාලනය පිළිබඳ මානව විද්‍යාවට සිදු වී ඇත්තේ කුමක් ද? 1980 ගණන් වලදී මිය ගිය බව පෙනුණ උප ශික්ෂණයක් වූ එය දැන් මානව විද්‍යාත්මක තර්කයේ කේන්ද්‍රයටම පැමිණ ඇත. ජාතිකවාදය, ගැටුම්, පුරවැසිභාවය යනාදී දේශපාලන තේමාවන්, මානව විද්‍යා ක්ෂේත්‍රය ඇතුළත්, එයින් ඔබ්බෙන් ආකර්ෂණීය අලුත් ශාස්ත්‍රීය කෘතිවලට ආවේශය සපයා ඇත. මේ තේමා පැමිණ

තිබෙන්නේ කොහෙන්ද, ඒවා මානව විද්‍යාවට මතු කරන්නේ කවර ආකාරයේ ප්‍රශ්නද, මේ පොතෙන් කරන්නට බලාපොරොත්තු වන්නේ මූලික තේමාවන් හා පොදු ගැටලු හඳුනාගනිමින් මානව විද්‍යාවේ මෑත කාලයේදී සිදු වී ඇති මෙම හැරීම ඇස්තමේන්තු කරමින්, අලුත් පර්යේෂණ සඳහා ප්‍රයෝජනවත් න්‍යාය පත්‍රයක් ද යෝජනා කිරීමයි." (Spencer, 2007: 1, සිංහල පරිවර්තනඃ උයන්ගොඩ, 2016ඃ 31).

**පර්යේෂණ ගැටලු කිහිපයක් සඳහා නිදසුන්,**

- **ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය සිදුවූයේ විජයාගමනයෙන් පසුව ද?**

(ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය පිළිබඳ විවිධ මතවාද පවතී. එය සමහරෙක් විජයාගමනයෙන් පසුව සිදු වූ බවට කරුණු ගෙනහැර දක්වන අතර සමහරෙක් විජයාගමනයට පෙර ජීවත් වූ ශ්‍රී ලාංකේය ජනතාව විසින්ම දිවයිනේ විවිධ පළාත්වල ජනාවාස වූ පිහිටුවාගත් බවට තොරතුරු ඉදිරිපත් කෙරේ. මෙය නොවිසිඳුණු ගැටලුවකි. මෙය විසඳා ගැනීමට ශාස්ත්‍රීය පර්යේෂණයක් සිදුකළ යුතු අතර එය පුරාවිද්‍යාත්මක හා සාහිත්‍ය මූලාශ්‍රගත ක්‍රමවේද ඔස්සේ සිදුකළ යුතුය.)

- තෙත් පරිසර කලාපයේ ප්‍රාග්-ඓතිහාසික මානවයා ජීවත් වීමට පාරිසරික සාධක පමණක් බල පෑවේ ද? (ප්‍රාග් මානවයාට ජීවත් වීමට ස්වභාවික පරිසරයේ පාරිසරික සාධක පමණක් බල පෑවේද නැතහොත් ඔවුන් විසින් සකසා ගත් වෙනත් කරුණුද මේ සඳහා පාදක වූයේද යන්න අවධානය යොමුකළ යුතුය. මෙය පර්යේෂණ ගැටලුවක් වන අතර එය නිරාකරණය සඳහා විධිමත් පර්යේෂණයක් සිදුකළ යුතුය.)

**3. සංදර්භය සහ පසුබිම**

මෙහිදී පර්යේෂණ මාතෘකාවට අදාළ පර්යේෂණ පසුබිම (Research Background) පිළිබඳව අවධානය යොමු වේ. සාකච්ඡාවට බඳුන් වන යෝජිත පර්යේෂණ ගැටලුවේ මතු වී තිබෙන්නා වූ

ඓතිහාසික, සමාජමය, ශාස්ත්‍රීය, න්‍යායික නැතහොත් සංදර්භය විස්තර කිරීමය. නිදසුනක් ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ වතුකම්කරුවන් මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වීම තුළින් පවුල් සංස්ථාවට එල්ලවන බලපෑම නම් පර්යේෂණ ගැටලුව සම්බන්ධ මෙවැනි මාතෘකාවකදී මත්ද්‍රව්‍යයේ අහිතකර බලපෑම (කායික, මානසික හා සමාජීය), එය පවුල් සංස්ථාව හා සම්බන්ධ වන ආකාරය වැනි කරුණු පිළිබඳ විස්තර කළ හැකිය. මෙය විස්තර කළ යුත්තේ පර්යේෂණ ගැටලුව පිළිබඳ නිවැරදි අවබෝධයකින් වන අතර එහිදී පවුල් සංස්ථාව යනු කුමක්ද? ලෝකයේ වෙනත් රටවල මෙවැනි පසුබිම් පිළිබඳ ආදිය විස්තර කිරීම අවශ්‍ය නැත.

## 4. පර්යේෂණයේ වැදගත්කම

පර්යේෂණය සිදුකිරීමේ වැදගත්කම මෙහිදී පෙන්වා දිය යුතුය. පර්යේෂණ අධ්‍යයනය තුළින් ලැබෙන ප්‍රතිඵල, ප්‍රතිලාභ වැදගත්කම් යටතේ සඳහන් කළ හැකිය. යෝජිත පර්යේෂණයේ තිබෙන ශාස්ත්‍රීය වැදගත්කම පහත සඳහන් අංශ තුනෙන් ම (03) එය අධ්‍යයනය කළ හැකිය (උයන්ගොඩ, 2016: 79).

- න්‍යායික - පර්යේෂණ තේමාවට සහ ගැටලුවට සම්බන්ධ පවත්නා න්‍යායික ප්‍රස්තුතයන් පරීක්ෂණයට ලක්කිරීමට යන්නේ ද? අලුත් න්‍යායික විග්‍රහයක් ගොඩනැගීමට පර්යේෂකයා අපේක්ෂා කරන්නේ ද? මින් එකක් හෝ දෙකක් කිරීමට අදහස් කරන්නේ නම් එය පර්යේෂණයේ න්‍යාය සම්පාදන වැදගත්කම කියාපෑමට උපකාරී වේ.

- අර්ථකථනාත්මක - යෝජිත පර්යේෂණය මගින් නව අර්ථකථන පදනම් කොටගෙන නව තර්ක, නව විග්‍රහ සහ අලුත් සංකල්ප ඉදිරිපත් කෙරේ නම් එය පර්යේෂණයේ වැදගත්කම කියාපායි.

- ආනුභවික - යෝජිත පර්යේෂණයෙන් නව දත්ත, සාක්ෂි සහ තොරතුරු ගවේෂණය කළ හැකිනම් එය ද පර්යේෂණයේ වැදගත්කම කියාපායි.

### 5. අරමුණු

පර්යේෂණය සිදුකිරීමෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක පර්යේෂණ අරමුණු (Objectives) ලෙස පෙන්වා දිය හැකිය. පර්යේෂණයේ අරමුණු පර්යේෂණයේ ස්වභාවය අනුව තීරණය වන අතර එහි අරමුණු කිහිපයක් තිබෙන්නට පුළුවන. පර්යේෂණයේ ප්‍රමුඛතම අංගය වනුයේ පර්යේෂණ අරමුණයි. එබැවින් පර්යේෂණ යෝජනාවලිය සකසන අවස්ථාවේ පර්යේෂණයෙන් අපේක්ෂා කරන දේ පිළිබඳ අවබෝධයක් පර්යේෂකයා සතුව තිබිය යුතුය. පර්යේෂණ ත්‍රිත්වයක පර්යේෂණ අරමුණු නිදසුන් ඇසුරින් තවදුරටත් මෙසේ පැහැදිලි කරගත හැකිය.

- තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් මානවයාගේ සංචරණය සිදු වූ ආකාරය තේරුම් ගැනීම.

- සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට නිවැරදි ආහාර රටාව පමණක් සුදුසුද යන්න ජනතාව දැනුවත් කිරීම.

- රාජ්‍ය නිලධාරීන් මහාපරිමාණයෙන් අල්ලස් ගැනීම හේතුවෙන් මහජනතාවට විඳීමට සිදුවන අපහසුතාවයන් පිළිබඳව දැනුවත් කිරීම.

### 6. සාහිත්‍ය විමර්ශනය

පර්යේෂණ යෝජනාවලියක සාහිත්‍ය විමර්ශනය (Literature Review) වැදගත් අංගයක් වන අතර මෙමගින් පර්යේෂණ ගැටලුව හඳුනා ගැනීමට මෙන්ම පර්යේෂණ ක්‍රමවේදය හඳුනා ගැනීමට ද පහසුවක් වේ. සාහිත්‍ය විමර්ශනයක් යනු යෝජිත පර්යේෂණය සඳහා පෙර අනාවරණයන් කොතෙක් දුරට වැදගත් වේදැයි හේතු සහිතව විග්‍රහ කර බැලීමකි. මෙමගින් අධ්‍යයනයට භාජනය වන තේමාවට සම්බන්ධව පවත්නා ශාස්ත්‍රීය ඥානය, විචාරාත්මක ඇස්තමේන්තුවකට ලක් කරේ. එමගින් ශාස්ත්‍රීය සාහිත්‍යය, අදාළ න්‍යාය, සංකල්ප, විග්‍රහ, තොරතුරු, නිගමන යනාදිය සමඟ විචාරාත්මක සංවාදයකට එළඹිය හැකිය (උයන්ගොඩ, 2016: 83). සාහිත්‍ය විමර්ශනය තුළින් අධ්‍යයන

විෂය ක්ෂේත්‍ර සම්බන්ධ ශාස්ත්‍රීය ඥානය පුළුල්ව අධ්‍යයනය කෙරේ. එමගින් පර්යේෂකයාට පහසුවෙන් පර්යේෂණ යෝජනාවලියේ ඍජු ඉලක්කයට ගමන් කළ හැකිය. පර්යේෂණ යෝජනාවලියක සාහිත්‍ය විමර්ශනය වැදගත් වීමට ප්‍රධාන කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමුකළ හැකිය (උයන්ගොඩ, 2016: 85, 86). එනම්

- පර්යේෂණයක් සිදුකරන අවස්ථාවේ එම පර්යේෂණය පිළිබඳව පවත්නා දැනුමේ හිස්තැන් අඩුපාඩු පිරිවීමට අවස්ථාව උදා වේ.
- සිදුකර ඇති පර්යේෂණයක් නැවත සිදුවන්නේ නම් එහි පර්යේෂණ ගැටලුව අලුත් එකක් බව පෙන්වීමට පර්යේෂකයාට මෙමගින් හැකියාවක් ලැබේ. සිදුකර ඇති පර්යේෂණයක් ඒ ආකාරයෙන් සිදුවීමට ද ඇති අවස්ථාව මගහැරේ. මෙය කළ හැකි වන්නේ හරවත් සාහිත්‍ය විමර්ශන අධ්‍යයනයකින් පමණි.
- හරවත් පර්යේෂණයක් කිරීමට පර්යේෂකයාට හැකියාවක් ඇත්දැයි යන්න සාහිත්‍ය විමර්ශනය තුළින් පරීක්ෂකවරුන්ට පෙනීයන කරුණකි. පර්යේෂණ යෝජනාවලිය සැකසීම සඳහා භාවිත කරන ග්‍රන්ථාවලිය පිළිබඳ පරීක්ෂකවරුන්ගේ අවධානය යොමුවන අතර ශාස්ත්‍ර සාහිත්‍යය යල්පැනගිය ඒවාද නැතහොත් සමකාලීන විද්වත් ප්‍රසාදයට ලක් වූ ග්‍රන්ථ ද යන්න පරීක්ෂාවට භාජනය වේ. සාහිත්‍ය විමර්ශනය යනු හුදෙක් ග්‍රන්ථ නාමාවලියක් ඉදිරිපත් කිරීමක්, කෘති ගැන කෙටි හැඳින්වීමක් නොව තේමාවට අදාළ පර්යේෂණ පැතිකඩ ව්‍යූහයක් තුළ සංවිධානය කොට ඉදිරිපත් කිරීමකි. පර්යේෂණ යෝජනාවලියක ග්‍රන්ථාවලිය සකස් කිරීමේදී කරුණු 05 ක් පිළිබඳව අවධානය යොමුකළ යුතුය. එනම්,
- පිටරටවල පළ වී ඇති නැතහොත් තුලනාත්මක සාහිත්‍යය (විදේශීය සාහිත්‍යය)
- රටේ පළ කර ඇති සාහිත්‍ය (දේශීය සාහිත්‍ය)
- න්‍යායික සාහිත්‍ය
- ආනුභවික සාහිත්‍ය
- මුද්‍රිත මෙන්ම මුද්‍රිත නොවූ සාහිත්‍ය යනුවෙනි.

## 7. පර්යේෂණ උපන්‍යාසය/කල්පිතය

උපන්‍යාසයක් යනු යම්කිසි ප්‍රපංචයක් මෙසේ සිදුවන්නේ යැයි අනුමාන පැහැදිලි කිරීමකි. ශාස්ත්‍රීය පර්යේෂණයක දී පර්යේෂණ අවසානයේ එළඹීමට අපේක්ෂිත නිගමන ප්‍රකාශන ලෙස ඉදිරිපත් කිරීම උපන්‍යාස (Hypothesis) ලෙස හැඳින්වේ. නැතිනම් ගවේෂණය කිරීමට අපේක්ෂිත ගැටලුව පිළිබඳ අස්ථිර වාක්‍ය සමූහයකි (ජයසූරිය, 2000; 3). අවසානයේ දත්ත විශ්ලේෂණයෙන් ලැබෙන ප්‍රතිඵල අනුව උපන්‍යාස පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදුවේ (සේනාධීර සහ වනසිංහ, 2004: 181). උපන්‍යාසයක් සකස් කිරීම සිදුවන්නේ කෙටි නිශ්චිත පැහැදිලි තනි වාක්‍යයකින් වන අතර එහි අපේක්ෂිත ස්වභාවය අනුව ප්‍රාමාණික දත්ත හෝ ගුණාත්මක දත්ත අපේක්ෂා කරන ආකාරයට එකම උපන්‍යාසය සකස් කරගත හැකිය.

උපන්‍යාස සඳහා නිදසුනක්,

"රජය නිසි පියවර ගන්නේ නම් පාසල් ළමුන් අතර මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වීම වළක්වා ගත හැකිය."

උපන්‍යාසයක් ලිවීමේදී සැලකිය යුතු කරුණු කිහිපයක් හඳුනාගත හැකිය (ජයසූරිය, 2000; 20).

- විස්තර කිරීමේ හැකියාව උපන්‍යාසය තුළ තිබිය යුතුය.
- විචල්‍යයන් අතර බලාපොරොත්තු වන සම්බන්ධතා පිළිබිඹු විය යුතුය.
- උපන්‍යාසය පරීක්ෂාවට භාජනය විය යුතුය.
- දැනට ගොඩනගා ඇති දැනුම් ක්ෂේත්‍රයට අනුකූල විය යුතුය.
- පහසුවෙන් අවබෝධ කරගත හැකිවන සේ උපන්‍යාස ලිවිය යුතුය.

උපන්‍යාසයක් ඉදිරිපත් කිරීමේදී සාහිත්‍ය විමර්ශන, නිරීක්ෂණය, න්‍යායන් හෝ සිද්ධාන්ත ආශ්‍රිතව යම් පර්යේෂකයෙකුට කල්පිත නැතහොත් උපන්‍යාස ඉදිරිපත් කළ හැකිය. උපන්‍යාසය ප්‍රකාශ කිරීමෙන් පසු එය සනාථ කිරීම හෝ නොකිරීම සිදුවිය හැකිය. සම්පරීක්ෂණ සැලසුම්වලදී හෝ විද්‍යාත්මක ක්‍රමයේදී හෝ ගැටලුව සඳහන් කිරීමෙන් පසු උපන්‍යාස ලිවීම ක්‍රමානුකූල පර්යේෂණ සැලැස්මක ලක්ෂණයක් ලෙස සලකනු ලබයි. විස්තරාත්මක පර්යේෂණ සැලසුමක උපන්‍යාස සඳහන් කිරීම අනිවාර්ය අංගයක් නොවේ. සම්පරීක්ෂණ ආකෘතියේ අවසාන ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශ කළ හැකි වුවද විස්තරාත්මක පර්යේෂණයේදී ප්‍රතිඵල පිළිබඳ අනාවැකි කීම අසීරු කටයුත්තකි.

## 8. පර්යේෂණ ප්‍රශ්න

පර්යේෂකයා, පර්යේෂණ යෝජනාව තුළ උපන්‍යාසය ඉදිරිපත් කිරීමෙන් පසු පර්යේෂණ ගැටලුවට (Research Problem) අදාළ පර්යේෂණ ප්‍රශ්න (Research Question) සංවර්ධනය කිරීම සිදුකළ යුතුය. පර්යේෂණ ප්‍රශ්න යනු පර්යේෂණ ගැටලුවට අදාළව පර්යේෂකයා පිළිතුරු සෙවීමට උත්සාහ කළයුතු ප්‍රශ්නයි. පර්යේෂණ ගැටලුවට අදාළ වන්නේ කුමන වර්ගයේ දත්ත ද, දත්ත රැස්කළ යුත්තේ කුමනාකාරයෙන් ද යන්න මග පෙන්වන්නේ පර්යේෂණ ප්‍රශ්නවලිනි (පරමානන්ද හිමි, 2014: 56). පර්යේෂණ ගැටලුව ලිහා ගැනීමට පර්යේෂකයාට ආධාර වන උපකාරකයක් වශයෙන් ද පර්යේෂණ ප්‍රශ්න පෙන්වා දිය හැකිය. පර්යේෂණ ගැටලුවක පර්යේෂණ ප්‍රශ්න කිහිපයක් තිබෙන්නට පුළුවන.

පර්යේෂණ ප්‍රශ්න සඳහා නිදසුන්,

**පර්යේෂණ ගැටලුව** - අනුරාධපුර රාජධානිය පිරිහීම සඳහා විදේශීය ආක්‍රමණ බලපෑවේද?

**පර්යේෂණ ප්‍රශ්න** - විදේශීය ආක්‍රමණිකයන් අනුරාධපුර රාජධානිය ආක්‍රමණය කළේ ඇයි?

අනුරාධපුර රාජධානිය පිරිහෙන අවධිය වන විට රාජ්‍ය පාලනය දුර්වලව පැවැතියේ ද?

පර්යේෂණයකදී පර්යේෂණ ප්‍රශ්න ගොඩනැගීමේදී පිළිතුරු දිය හැකි ප්‍රශ්න ගොඩනැගිය යුතු අතර දත්ත රැස්කිරීමට උපකාරි වන ආකාරයේ ප්‍රශ්න ඒ සඳහා වඩාත් උචිත වේ. ඒ අනුව සමීක්ෂණ, නිරීක්ෂණ, පරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා වැනි මිනුම් මගින් දත්ත රැස්කර ගැනීමට පුළුවන. එනමුත් පර්යේෂණ ප්‍රශ්න සැකසීමේදී බැහැර කළ යුතු ප්‍රශ්න වර්ග තුනක් හඳුනාගත හැකිය. දාර්ශනික ප්‍රශ්න, සදාචාරාත්මක ප්‍රශ්න සහ මනඃකල්පිත ප්‍රශ්න යනුවෙනි. මෙම ප්‍රශ්නවලට, පිළිතුරු සෙවීම සඳහා දත්ත රැස් කිරීමට නොහැකි, ප්‍රශ්න ගොඩනැගුව ද පිළිතුරු නොමැති, දාර්ශනික, පුද්ගල විශ්වාස, පුද්ගල වටිනාකම් මත පදනම් වූ අධ්‍යාත්මික හෝ අනියමාර්ථ ප්‍රශ්න මේ සඳහා අදාළ කරගත නොහැකිය. මෙවැනි ප්‍රශ්න කිසි විටෙකත් පර්යේෂණ යෝජනාවලියක ඇතුළත් නොවිය යුතුය.

**09. පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රම**

පර්යේෂණ ක්‍රමවේදය (Research Methodology) යනුවෙන් හඳුන්වන්නේ පර්යේෂණ ගැටලුව ආමන්ත්‍රණය කරන විලාසය සහ පර්යේෂණ ප්‍රශ්නවලට පිළිතුරු සපයන විලාසය නිගමනය කිරීමයි. සමස්ත පර්යේෂණයට මාර්ගෝපදේශනය සපයන්නේ පර්යේෂණ ක්‍රමවේදය බැවින් පර්යේෂණ යෝජනාවලියේ සාර්ථකත්වය සඳහා සෘජුවම බලපායි. මේ නිසා පර්යේෂකයා සුදුසු පර්යේෂණ ක්‍රමවේදයක් පර්යේෂණ යෝජනාවලියේ පැහැදිලිවම සඳහන් කළ යුතුය. මෙහිදී එම පර්යේෂණය ගුණාත්මක, ප්‍රමාණාත්මක හෝ මිශ්‍ර පර්යේෂණ උපක්‍රම හෝ අනුමගනය කරන්නේ ද යන්න සඳහන් කළ යුතුය. එමගින් ඊට සමානුරූපීව පර්යේෂණ ක්‍රමවේදය පහසු කරගත හැකිය (පරමානන්ද හිමි, 2014; 88, 89). පර්යේෂණ ගැටලුවේ ස්වභාවය අනුව පර්යේෂණ ක්‍රමවේදයද, පර්යේෂණ ක්‍රමවේදය අනුව පර්යේෂණ ක්‍රම (Research Methods) භාවිත වේ. මෙහිදි පර්යේෂණ කාර්ය කරන්නේ කෙසේ ද? පර්යේෂණ ප්‍රශ්නවලට අදාළ දත්ත හා තොරතුරු ලබා ගැනීමේ ප්‍රායෝගික පියවර මොනවා ද? එකතු කළ යුත්තේ කවර ආකාරයේ දත්ත ද? යන්න අවධානය යොමු කළ යුතුය. ප්‍රත්‍යෙක

අධ්‍යයන, මහජන මත විමසීම්, නියැදි සමීක්ෂණ, කුටුම්බ සමීක්ෂණ, කණ්ඩායම් සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණ, ප්‍රභූ මත සමීක්ෂණය යන මේවා දත්ත සොයා ගැනීමේ විධික්‍රම සඳහා නිදසුන් වේ. පර්යේෂණ ක්‍රමයක් යනු පර්යේෂණ ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමේ මූලෝපායික ක්‍රමය ලෙස හැඳින්වේ. එක් එක් පර්යේෂණ සඳහා භාවිත කළ හැකි පර්යේෂණ ක්‍රම මොනවා ද යන්න පර්යේෂකයා විසින්ම පර්යේෂණයට අනුරූපිව සකසා ගත යුතුය. පර්යේෂණ ප්‍රශන්වලට පිළිතුරු ලබා ගැනීමේ දී කවරාකාරයේ දත්ත සහ විධික්‍රම වඩාත් යෝග්‍ය වන්නේ ද යන්න අවධානය යොමු කළ යුතුය.

පර්යේෂණයේ දී නියැදිය, දත්ත රැස්කිරීමේ උපකරණ, දත්ත රැස්කරන ආකාරය, දත්ත විශ්ලේෂණය සහ දත්ත අර්ථ නිරූපණය යන පියවරයන් අනුගමන කෙරේ. නියැදිය යනු පර්යේෂණය සඳහා දත්ත ලබාගැනීමට යොදා ගන්නා ජනගහනයෙන් තෝරාගත් කොටසය. නියැදියේ ප්‍රමාණයට වඩා ජනගහනය නියෝජනය වන නියැදියක් තෝරාගැනීම වැදගත් වේ (සේනාධීර සහ වනසිංහ, 2004: 183). තෝරාගත් අධ්‍යයනය සඳහා නියැදිය තෝරාගන්නා ආකාරය හා ප්‍රමාණය දැක්වීම අවශ්‍ය වේ. පර්යේෂණයක පර්යේෂණ සැලසුම සහ පර්යේෂණ ගැටලුව, පර්යේෂණ ප්‍රශ්න සහ උපන්‍යාසවලට අනුරූපව දත්ත රැස්කිරීමේ උපකරණ තෝරා ගැනෙයි. මේ අනුව ප්‍රමාණාත්මක අධ්‍යයනයකදි ප්‍රජානන පරීක්ෂණ, ආකල්ප පරිමා නිරීක්ෂණ සටහන් ආදිය භාවිත වෙයි. ගුණාත්මක අධ්‍යයනයක දී නිරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ භාවිත වේ. දත්ත රැස්කිරීමේදී පර්යේෂණයට අදාළ දත්ත යැයි තීරණය කරගැනීමට පහසුවන පරිදි දත්ත සරල ලෙස වර්ගීකරණය කළ හැකිය (උයන්ගොඩ, 2016: 104). එනම්,

**ප්‍රාථමික දත්ත**

මූලාශ්‍රයවලින් පර්යේෂකයා ලබා ගන්නා තොරතුරුය. මූලික මූලාශ්‍රය, සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, නිරීක්ෂණ හා සහභාගිත්ව නිරීක්ෂණවලින් ලබා ගන්නා ප්‍රාථමික දත්තයන් ය.

**ද්විතීයික දත්ත**

පුවත් පත්, පොත් පත් යනාදී ද්විතියික මූලාශ්‍රය.

**ගුණාත්මක දත්ත**

අදහස්, මතවාද, කතන්දර, ස්මරණ, ප්‍රත්‍යෙක අධ්‍යයන යනාදිය වෙතින් ලබා ගන්නා සංඛ්‍යාත්මක නොවන තොරතුරු ය. මෙය ප්‍රාථමික මෙන්ම ද්විතියික මූලාශ්‍රයවලින් ද ලබාගත හැකිය.

**ප්‍රමාණාත්මක දත්ත**

ජනගහණය, ආර්ථික තත්ත්වය, කාලගුණය, පවුල්වල ආදායම් වැනි සංඛ්‍යාත්මක වශයෙන් ලබා ගන්නා දත්තයන් ය. මේවාද ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍රයවලින් ලබාගත හැකිය.

නියැදි, මිනුම් උපකරණ ආශ්‍රයෙන් ලබාගත් දත්ත රැස්කර වර්ගීකරණයෙන් පසු දත්ත විශ්ලේෂණය කළ යුතුය. මෙය සැමවිටම පර්යේෂණ ප්‍රශ්න සහ රැස්කරන ලද දත්ත මත පදනම්ව සිදුවේ. පර්යේෂණ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකි දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයක් තෝරා ගැනීම වැදගත් වේ. දත්ත විශ්ලේෂණයේදී දත්ත අර්ථ නිරූපණය කිරීමද අවශ්‍ය වේ. දත්ත විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය කිරීම සහ පර්යේෂණ ගැටලුව හෝ ප්‍රශ්න කෙරෙහි පර්යේෂණ ක්‍රමවේදයේ අදාළතාව කෙබඳුද යන්න අවධානය යොමු කළ යුතුය. පර්යේෂණ ක්‍රමවේදය සහ පර්යේෂණ ක්‍රම අතර වෙනස දී ඇති පහත වගුවේ නිදසුන් මගින් පැහැදිලි වේ.

| පර්යේෂණ ක්‍රමවේදය | පර්යේෂණ ක්‍රම |
|---|---|
| ක්ෂේත්‍ර පර්යේෂණ | සම්මුඛ සාකච්ඡා<br>නිරීක්ෂණය<br>කණ්ඩායම් සාකච්ඡා |

**10. පර්යේෂණ සීමා**

ඕනෑම පර්යේෂණ මාතෘකාවක අධ්‍යයන සීමාවන් (Research Scope) පවතී. මෙසේ හඳුනාගත් අධ්‍යයන සීමාකම් සඳහන් කිරීම අධ්‍යයනයේ වටිනාකම වැඩිවීමට හේතුවක් වේ. මෙමගින්

පර්යේෂකයාට යම් අධ්‍යයන සීමාවක් තුළ තම පර්යේෂණය කිරීමට අවස්ථාව උදා කරයි. මෙහිදි පර්යේෂණ සැලසුම, දත්ත විශ්ලේෂණ, කාලය, සම්පත් පිළිබඳ සීමා ඇතුළත් වේ. පර්යේෂණයක සීමා තබා ගැනීම පර්යේෂණයේ ප්‍රතිඵල කෙරෙහි බලපෑම් කරන එක්තරා දුර්වල කරුණකි. පර්යේෂකයා පර්යේෂණයක සීමා පනවා ගන්නේ පර්යේෂණය සාර්ථකව නිම කිරීමටය. එබැවින් පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනවශ්‍ය බලපෑමක් ඇති නොවන පරිදි පර්යේෂණ සීමා තබා ගැනීම වඩාත් උචිතය.

## 11. පර්යේෂණ සැලැස්ම

මෙය පර්යේෂණ යෝජනාවලියේ අවසන් කොටස වන අතර පර්යේෂණ ක්ෂේත්‍රය විස්තර කිරීම, දත්ත එකතු කිරීමේ පියවර සහ එක් එක් පර්යේෂණ කාර්යයන් කෙටියෙන් විස්තර කිරීම සහ පර්යේෂණ කාලසටහන දැක්වීම සිදුවේ. මෙය පර්යේෂණ සැලැස්ම (Research Planing) වේ. පර්යේෂණයක් සැලසුම් කිරීමේ දී පර්යේෂණයට යොදවන දෑ සහ පර්යේෂණ අවසානයේ ඉන් සොයා ගැනීමට අපේක්ෂා කරන දේ පැහැදිලි විය යුතුය. මෙහිදී පර්යේෂණ ගැටලුවක් තුළින් ගොඩනගා ගත් කල්පිත හෝ විස්තරාත්මක අරමුණු ඉටුකරගන්නා ආකාරයත් ඉන්පසු එළැඹෙන නිගමන එම ක්‍රියාවලියට බලපාන අයුරුද සැළසුම් කොට ඇතුළත් කිරීම වැදගත් වේ (ලලිතධීර, 2018: 41). තමන් තෝරාගන්නා පර්යේෂණය, පර්යේෂණ ප්‍රශ්නවලට ගැළපෙන ලෙස පර්යේෂණ සැලැස්ම සකසා ගත යුතුය. එම පර්යේෂණ ක්‍රමවේදය ප්‍රායෝගිකව සිදුකළ හැකිද යන්න අවධානය යොමු කිරීම මෙහිදී වැදගත් වේ.

## 12. ආශ්‍රිත ග්‍රන්ථ

පර්යේෂණ යෝජනාවලිය සැකසීමේදී භාවිත කළ හැකි සියලුම පර්යේෂණ ග්‍රන්ථ/වාර්තා, පොත්, විද්‍යාත්මක සඟරා, ලිපි, වෙනත් වාර්තා සහ අන්තර්ජාල වෙබ් අඩවි ආදී ආශ්‍රිත ග්‍රන්ථ (Reference) ලෙස ඇතුළත් කළ හැකිය. නිරතුරුවම ඉහළ ප්‍රමිතියකින් යුත් පර්යේෂණ මූලාශ්‍රය භාවිත කිරීමට උත්සාහ ගත යුතුය. ග්‍රන්ථ නාමාවලිය ඉදිරිපත් කිරීමේදී පිළිගත් ක්‍රමවේදයක් යටතේ එය ඉදිරිපත්

කළ යුතුය. ආශ්‍රේය කරගත් කෘති පමණක් ඉදිරිපත් කළ යුතු අතර රචනා චෞරත්වය මග හරවා ගැනීමට අවංක විය යුතුය. ලිපි ලේඛන සහ අන්තර්ජාල තොරතුරු ලබා ගැනීමේදි නිවැරදි තොරතුරුම ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය.

මෙම පර්යේෂණ යෝජනාවලියේ ආකෘතියට අමතරව කාල රාමුව සහ අයවැය ඇස්තමේන්තුවද පර්යේෂණ යෝජනාවලියට එකතු කළ යුතුය. මේ සියල්ල නිවැරදිව සම්පූර්ණ වූ විට ශාස්ත්‍රීය පර්යේෂණ යෝජනාවක ස්වභාවය සහ වපසරිය පෙන්වයි. පර්යේෂණ යෝජනාව යනු දළ සටහනක් නොවන අතර මුළු පර්යේෂණයටම මග පෙන්වන්නේ පර්යේෂණ යෝජනාව විසින්ය. පර්යේෂණ යෝජනාවලියක් කිහිප වතාවක් ලිවීමට සිදුවිය හැකි අතර එමගින් හරවත් සහ වඩාත් නිවැරදි පර්යේෂණ යෝජනාවලියක් සකසා ගත හැකිය. රචනා කුසලතාව මෙන්ම අක්ෂර වින්‍යාසය, පද බෙදීම ආදී ව්‍යාකරණ රීති පිළිබඳව ද අවධානය යොමුකළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**අධ්‍යාපන පර්යේෂණකරණයේදී පර්යේෂණ යෝජනාවක් ලිවීමට උපදෙස්** (2013). පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

අබේපාල, රෝලන්ඩ් (2008). **දත්ත රැස්කිරීමේ උපකරණ.** කොට්ටාවඃ සාර ප්‍රකාශන.

උයන්ගොඩ, ජයදේව (2016). **සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම.** කොළඹඃ සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.චන්ද්‍ර, ජයසූරිය (2000). අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප. කොට්ටාවඃ සාර ප්‍රකාශන.

ජයසේන, අශෝකා සහ කුමාරි, ඇම්බැක්කේ (2015). **පර්යේෂණ ක්‍රමවිද්‍යා ප්‍රවේශය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහෝදරයෝ.

පරමානන්ද හිමි, පොල්ගස්වත්තේ (2014). **පර්යේෂණ නිබන්ධ අත්පොත.** කොළඹඃ ඇස් ගොඩගේ සහෝදරයෝ.

පෙරේරා, ඥානදාස (2011). **පර්යේෂණ ක්‍රමවිද්‍යා.** කොළඹඃ සහස්‍ර ප්‍රකාශකයෝ.

ලලිතධීර, කේ. ඒ. (2018). **පර්යේෂණ ක්‍රමවේදය සහ ක්‍රම.** මහරගමඃ
සේනාධීර, සිල්වි සහ වනසිංහ, ශාමින්ද (2004). **පර්යේෂණ ක්‍රමවේද** කොළඹඃ ඇස්. ගොඩගේ සහෝදරයෝ.

Heath, M. Tersa Pereira and Tynan, Caroline (2010). **Crafting a Research Proposal**, The Marketing Review, Vol.10, No 2, P 44 - 130

Langenbach, M (1993). **Methodology of Research in Social Science**, Bombay: Himalaya Publishing House.

Ray, G.L, and Mondal, S, (2004). **Social Research Methodology** Deverly Hills: Sage.